# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/Covid-19 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2021.05.20 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමණාකරුවන්,
සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත

**<u>වත්මන් කොවිඩ්-19 අධිවසංගත තත්ත්වය හමුවේ සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</u>**

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම වෙසෙන ජනතාව කොවිඩ්-19 අධි වසංගතය හේතුවෙන් මේ වන විට ගැටලුකාරී තත්වයන්ට ගොදුරු වී ඇත.

**02.** සමෘද්ධිලාභී හා අඩු අදායම්ලාභීන් ඉලක්ක කර ගෙන දිළිදුකම පිටුදැකීම සඳහා වන ප්‍රධානතම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අප ආයතනයේ නිලධාරීන්ද මෙවැනි පසුබිමක් හමුවේ විවිධ දුෂ්කරතාවයන්ට මුහුණපා ඇති බව නොරහසකි.

**03.** පසුගිය වර්ෂයේදී කොවිඩ්-19 අධි වසංගත තත්ත්වය ආරම්භයේ පටන්ම අඩු ආදායම් ප්‍රජාව වෙනුවෙන් ඉතා කැපවීමකින් යුතුව ඔබ සෑම රාජකාරී කටයුතු කිරීම සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී ප්‍රශංසාවට ලක්වීම පිළිබඳව ගෞරවයෙන් සිහිපත් කරමි. 2020 වර්ෂයේදී ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකායේ උපදෙස් මත දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකම ගෙවතු වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිඩාවට ලක්වූ ජනතාවට මහත් අස්වැසිල්ලක් විය.

**04.** මෙම වර්ෂයේදීත් ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් ලබා දුන් උපදෙස් මත ගෙවතු වගා සංවර්ධන වැඩසටහන, 2021 අයවැය යෝජනා අනුව සමෘද්ධිලාභී පවුල් 200,000ක් සවිබල ගැන්වීම ඇතුළුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංශ මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති මෙම අසීරු කාලපරිච්ඡේදය තුලදී ක්‍රියාත්මක කළ යුත්තේ නිලධාරීන්ගේ හා ප්‍රතිලාභීන්ගේ සෞඛ්‍යාරක්ෂාවට ද මුල් තැන දෙමිනි.

**05.** එසේ වුවද මෙම කටයුතු සිදුකිරීමේ දී අපගේ නිලධාරීන්ට සිදු වන අපහසුතා පිළිබඳව වෘත්තීය සංගම් රැසක් මඟින් කරුණු දක්වා ඇත. එම සියලු ඉල්ලීම් සැලකිල්ලට ගෙන මෙම අසීරු අවස්ථාවේ අත්‍යාවශ්‍ය රාජකාරී පමණක් ඉටු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලමි. ඒ ඒ ස්ථාන වල පවතින තත්ත්වය


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

සැලකිල්ලට ගෙන තම රාජකාරී කළමණාකරණය කර ගැනීමට අවශ්‍ය පහසුකම් සපයන ලෙස ද කාරුණිකව දන්වමි. විශේෂයෙන් ම සමෘද්ධි බැංකු හා බැංකු සමිති සඳහා මසකට රුපියල් 50,000/-ක් දක්වා සෞඛ්‍ය ආරක්ෂක ද්‍රව්‍ය වෙනුවෙන් වියදම් දැරීමට ලබා දී ඇති බලතල හා ප්‍රතිපාදන අනුව දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් හා අත්‍යාවශ්‍ය සේවයේ යෙදෙන ප්‍රජාමූල සංවිධාන වල නිලධාරීන්ට ද එම ද්‍රව්‍ය ලබා දීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

**06.** ඒ අනුව මෙම කාර්යයන් සිදුකිරීමේදී හැකිතාක් සංචරණ සීමාවන්ට අනුගත වෙමින් සෞඛ්‍ය හා ආරක්ෂක අංශ මගින් ලබා දී ඇති උපදෙස් නිසි පරිදි අනුගමනය කිරීම අප සැමගේ වගකීමක් වනු ඇත. එබැවින් මීට පෙර ඔබ වෙත උපදෙස් ලබා දුන් පරිදිම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ජනතාව එක්රැස් කිරීම, සමීක්ෂණ කටයුතු සිදුකිරීම තාවකාලිකව අත්හිටුවීම සුදුසු වන අතර ප්‍රතිලාභීන් සඳහා වන දැනුවත් කිරීම් හා තොරතුරු ලබා ගැනීම, දුරකථන, විද්‍යුත් තැපැල, වෙබ් අඩවි, සමාජ ජාල හා Zoom තාක්ෂණය වැනි ක්‍රමයන් ඔස්සේ හුවමාරු කරගැනීම කාලෝචිත වේ.

**07.** ඔබ සැමගේ මනා කැපවීම තුළින් මේ වන විට බැංකු පරිගණකගත කිරීමේ කටයුතුද සාර්ථක ලෙස සිදුවෙමින් පැවතීම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා වඩාත් පහසුවක් වනු ඇත. එහෙත් එහි ක්ෂේත්‍ර පරීක්ෂණ වැනි කටයුතු තාවකාලිකව කල් ගැනීමට පියවර ගත හැකිය. ඒ අනුව ලබා දී ඇති කාලය දීර්ඝ කරන දිනය බැංකු කළමණාකරණ මණ්ඩල තීරණය අනුව කඩිනමින් දැනුම් දීමට කටයුතු කරමි.

**08.** ඒ අනුව සෞඛ්‍ය අංශ ඇතුළු අනෙකුත් අංශ මගින් නිරන්තරයෙන් ලබා දෙන උපදෙස් හා අනුගත වෙමින් කොවිඩ්-19 අධි වසංගතය හමුවේ ආරක්ෂාකාරී වෙමින් රාජකාරී කටයුතු සිදුකරන ලෙස වැඩිදුරටත් සඳහන් කරමි . මේ පිළිබඳව ඔබ සැම දක්වන සහය හා කැපවීම ස්තූතිපූර්කව සිහිපත් කරමි.

ආර්. පී. බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම්, සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස
2. සියලුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
3. සියලුම වෘත්තීය සමිති ලේකම්වරුන් - අ.ක.ස.